**අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය - අදියර 01 - 2022**

-------------------------------------------------------------------------

අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය - අදියර 01 හි 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය අතර 2013 මාර්තු 14 දින එලඹි අංක එස් එල් -පී 110 දරන ණය ගිවිසුමේ ව්‍යාපෘති ලියවිල්ලේ 14 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කලයුතු යැයි මා සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වර්තමානයේ ජල සම්පාදන හා වතුයටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ අනුරාධපුර උතුර ප්‍රදේශයේ ජල සම්පාදන පද්ධතියක් ඉදිකිරීම මඟින් ආරක්ෂිත පානීය ජලය සැපයීම හා ජල සම්පාදන ආවරණ ප්‍රදේශය වැඩිකිරීම සහ එමඟින් ප්‍රදේශයේ සනීපාරක්ෂක තත්ත්වය හා සෞඛ්‍ය තත්වය වර්ධනය කිරීම් වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 11,515 කට සමාන ජපන් යෙන් මිලියන 6,817 ක් වන අතර ඉන් රු.මිලියන 8,726 කට සමාන ජපන් යෙන් මිලියන 5,166 ක් මූල්‍යායනය කිරීමට ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය විසින් එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 පෙබරවාරි මස ආරම්භ කර තිබුණු අතර 2018 පෙබරවාරි මස වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි. පසුව, ව්‍යාපෘති කාල සීමාව 2024 ජනවාරි 05 දින දක්වා තෙවරක් දීර්ඝ කර ඇත.

**1.3 මතය**

2022 දෙසැම්බර 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල ව සත්‍ය හා සාධාරණ තත්වයක් පිලිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු / විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට කොන්ත්‍රාත්කරුවන් සහ උපදේශන සේවා සමාගම විසින් සපයන ලද 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා මගින් තහවුරු කරන ලද කාර්යාල උපකරණ, කාර්යාලීය ගෘහභාණ්ඩ සහ පරිගණක යන අයිතම 178 ක් සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | භාර දුන් වත්කම් සඳහා ප්‍රාග්ධනීකරණ ක්‍රියාවලිය ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානය (උතුරු මැද) ආරම්භ කර ඇති අතර ඉතිරි වත්කම් සඳහා 2023 වර්ෂයේ ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදු කරනු ඇත. කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාණපත්‍ර ලේඛනවල සඳහන් වත්කම් අයිතම 178 හි වටිනාකම රු. මිලියන 17.97 කි. නමුත් මේ සියලු වත්කම් ස්ථාවර වත්කම් නොවන අතර ප්‍රමාණපත්‍ර අනුව රු. මිලියන 17.97 තුල කාර්යාල ස්ථාපන වියදම්, ජල සැපයුම්, විදුලිය, ලිපිද්‍රව්‍ය, සහ ප්‍රථමාධාර පහසුකම් සඳහා වියදම් ආදියෙන් සමන්විත වේ. | ප්‍රමාණපත්‍ර අයිතම යටතේ කොන්ත්‍රාත්කරුවන් විසින් සපයනු ලැබූ වත්කම් මෙන්ම ඉතිරිව ඇති ස්ථාවර වත්කම් ප්‍රාග්ධනීකරණය කිරීමට ක්‍රියා කළ යුතුය. ව්‍යාපෘති කාර්යාලය විසින් එම වත්කම් පිළිබඳ පැහැදිලි වාර්තා තබාගෙන නොතිබූ බැවින් ගිණුම්වලට ගැනීමට පෙර එම වත්කම් හඳුනාගෙන වර්ගීකරණය කළ යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතිය 2013 පෙබරවාරි මස එහි කටයුතු ආරම්භ කළ අතර වසර පහක් ඇතුළත අවසන් කිරීමට සැලසුම් කර ඇත. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ආරම්භ වූ දින සිට වසර නවයක් සහ මාස දහයක් ගත වී තිබුණද, ව්‍යාපෘතියේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 98.56ක් සහ සියයට 92.3ක් ලෙස පැවතුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතිය ලබාගෙන තිබුණේ භෞතික ප්‍රගතියෙන් සියයට 2.78ක් පමණි. ව්‍යාපෘතියේ එක් එක් ක්‍රියාකාරකම්වල සමුච්චිත ප්‍රගතිය පහත පරිදි වේ.

| අංකය | ව්‍යාපෘති ක්‍රියාකාරකම | 2022 දෙසැම්බර් 31 දිනට | | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත ඉලක්කය (%) | සත්‍ය ප්‍රගතිය (%) | | | |
| (අ) | ඉසින්බැස්සගල කලාපයේ පීවීසී පයිප්ප සැපයීම, ඇතිරීම, සවිකිරීම් සහ ඩීඅයි සහ ජීඅයි පයිප්ප ඇතිරීම, සවි කිරීම. (ලොට් සී-1) | 100 | 95 | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණ සාක්ෂාත් කර ගැනීම තවදුරටත් ප්‍රමාද වනු ඇති බවට නිරීක්ෂණය කෙරේ. | ලොට් බී සහ ලොට් සී සම්බන්ධතා සම්පූර්ණ නොකිරීම හේතුවෙන් ලොට් සී1 සහ ලොට් සී3 නල සේදීමේ සහ විෂබීජහරණ කටයුතු ප්‍රමාද විය. කෙසේ වෙතත්, 2023 අගෝස්තු මාසයේ සිට ලොට් සී1 හි ජල සම්බන්ධතා ඇතිකිරීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් කටයුතු ආරම්භ කර ඇත. | මෙම සංරචකයේ ඉතිරි කාර්යය සම්පූර්ණ කිරීම සඳහා කඩිනමින් පිළියම් යෙදිය යුතුය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (ආ) | ඇතාකඩ කලාපයේ පීවීසී පයිප්ප සැපයීම, ඇතිරීම්, සවිකිරීම් සහ ඩීඅයි සහ ජීඅයි පයිප්ප ඇතිරීම, සවි කිරීම. (ලොට් සී-3) | 100 | 96 | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණ සාක්ෂාත් කර ගැනීම තවදුරටත් ප්‍රමාද වනු ඇති බවට නිරීක්ෂණය කෙරේ. | කොන්ත්‍රාත්කරු විසින් නල සේදීම සහ විෂබීජහරණ කටයුතු 2023 ජූලි මාසයේ සිට නැවත ආරම්භ කර ඇති අතර මේ වන විට කිලෝමීටර් 44 ක් නල සේදීම සහ කිලෝමීටර් 28 ක විෂබීජහරණ කටයුතු අවසන් කර ඇත. (කි.මී. 116ක් සේදීම, කි.මී. 132 විෂබීජහරණය සහ ලොට් බී හා ලොට් සී ජලනල සම්බන්ධ කිරීම් ස්ථාන 58 ක කටයුතු තවදුරටත් ඉතිරිව ඇත) | පිරිසිදු කිරීමේ හා විෂබීජහරණ කටයුතු කඩිනම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු අතර කාල රාමුව තුළ කොන්ත්‍රාත්කරුගේ වැඩ පිළිබඳව නිතිපතා සමීපව අධීක්ෂණය කළ යුතුය. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ කටයුතු 2013 පෙබරවාරි මස ආරම්භ කළද, ව්‍යාපෘතියේ අනෙක් කොටස් ආරම්භ කිරීමට පෙර ආරම්භ කළ යුතු ප්‍රධාන කොන්ත්‍රාත්තු වූ තුළුමුව ඉදිකිරීම, ජල පිරිපහදුව, භූගත ජලාශ, ජල කුළුණු, කාර්යාල ගොඩනැගිලි, යාන්ත්‍රික හා විදුලි වැඩ යනාදිය ව්‍යාපෘති වැඩ ආරම්භ කොට වසර පහකට පසු 2018 මාර්තු මාසයේදී ඉදිකිරීම් ආරම්භ කොට තිබුණි. මෙම ප්‍රමාදය ප්‍රධාන වශයෙන් සමස්ත ව්‍යාපෘතියේ දුර්වල ක්‍රියාකාරිත්වයට බලපෑ අතර මෙය ලංසු ලේඛන පිළියෙල කිරීමේ සහ ටෙන්ඩර් ඇගයීම් ක්‍රියාවලියේදී ඇතිවූ සැලකිය යුතු ප්‍රමාදයක ප්‍රතිඵලයක් බව නිරීක්ෂණය විය. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | නියමිත කාල සීමාව ඇතුළත ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කිලෝමීටර් 88.7 ක එච්ඩීපීඊ සම්ප්‍රේෂණ නල එළීම සහ කිලෝමීටර් 163ක එච්ඩීපීඊ බෙදාහැරීමේ නල එළීම යන නල සැපයීම සහ එළීම සඳහා වූ ප්‍රධාන කොන්ත්‍රාත්තුව (ලොට් බී කොන්ත්‍රාත්තුව) 2017 නොවැම්බර් 08 දින ප්‍රදානය කර තිබූ අතර එය වසර 2 ක් ඇතුළත නිම කිරීමට නියමිතව තිබුණි. කොන්ත්‍රාත් කාලය 2022 අගෝස්තු 31 දක්වා වාර 08 ක් දීර්ඝ කර තිබුණද, 2022 දෙසැම්බර් 31 වන විට සමස්ත භෞතික ප්‍රගතිය සියයට 98 ක් ලෙස පැවතිණි. තවද ලොට් බී සහ ලොට් සී හි නල සම්බන්ධ කිරීම් ස්ථාන 147 ක් සිදු කිරීමට නියමිතව පැවතියද 2023 ජූලි 19 දින වන විටත් ව්‍යාපෘතිය යටතේ නල සම්බන්ධ කිරීම් 12ක් පමණක් සිදු කර ඇති බව නිරීක්ෂණය විය. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කටයුතු තවදුරටත් ප්‍රමාදයකින් තොරව නිම කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.3 භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ කරුණු

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භූගත ජලය පානය හේතුවෙන් දන්ත සහ අස්ථි ෆ්ලෝරෝසිස් මෙන්ම නිදන්ගත වකුගඩු රෝග ඇතිවීමට වැඩි නැඹුරුවක් ඇති අනුරාධපුර දිස්ත්‍රික්කයේ මැදවච්චිය සහ රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ග්‍රාමනිලධාරි වසම් 75ක් ආවරණය වන පරිදි පවුල් 25,000 කට අයත් 115,000 ක පමණ ජනගහනයකට සුරක්ෂිත පානීය ජලය ලබාදීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය 2013 වසරේදී ආරම්භ කර තිබුණි. ව්‍යාපෘතිය වසර 10 ක් තුල කාලය දීර්ඝ කිරීම් 8 ක් සිදුකරමින් රුපියල් මිලියන 8,285 ක් වැය කර ඇති අතර, සමාලෝචිත වසර අවසානයේදී ව්‍යාපෘතිය සියයට 90 කට වඩා ප්‍රගතියක් වාර්තා කර ඇති නමුත් රජය විසින් උපයෝජනය නොකරන ලද එකගවූ ණය වෙනුවෙන් බැදීම් ගාස්තු ලෙස රුපියල් මිලියන 45.68ක් සහ ප්‍රාග්ධන ආපසු ගෙවීම් ලෙස රුපියල් මිලියන 1,309 ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන ජල මූලාශ්‍රය වන මහකනදරාව ජලාශයෙන් දිනකට අවශ්‍ය ඝන මීටර් 9,400 ක ජල ධාරිතාවය ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිඵල ප්‍රතිලාභීන් වෙත ලබා ගත නොහැකි වී තිබිණි.<br><br>ව්‍යාපෘතියට ජලය නිකුත් කිරීමට ගොවි සංවිධානවල අඛණ්ඩ විරෝධයක් තිබූබව 2023 ජූලි 19 වන දින ක්ෂේත්‍ර පරීක්ෂාවේදීද විගණනට නිරීක්ෂණය වූ අතර මෙම විරෝධයට හේතුව ශක්‍යතා අධ්‍යයනයේදී සලකාබලා නොතිබුණි. | ණය වියපැහැදම් කාලය 2024 ජනවාරි දක්වා දීර්ඝ කර ඇතත්, ණය නැවත ගෙවීමේ කාලරාමුව සංශෝධනය කර නොතිබුණි. එබැවින් කාලසටහනට අනුව නැවත ණය ගෙවීම ආරම්භ කර තිබුණි. ව්‍යාපෘතිය ආරම්භයේදී නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර ඇති අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව අතර 2012 වසරේ අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇත. කෙසේ වෙතත් ගොවීන්ගේ විරෝධතා හේතුවෙන් අත්සන් කළ අවබෝධතා ගිවිසුමේ එකඟ වූ පරිදි අවශ්‍ය ජල ප්‍රමාණය නිකුත් නොකෙරේ. කෙසේ වෙතත්, දිස්ත්‍රික් ලේකම්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ගොවි සංවිධාන සමඟ රැස්වීම් මාලාවක් පැවැත්වීමෙන් සහ ගොවීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමෙන්, ජල සම්පාදන මණ්ඩලයට අක්කර අඩි 312 ක ජලය (2022 ඔක්තෝබර් සිට 2023 අගෝස්තු දක්වා), පරීක්ෂා කිරීම, නල සේදීම සහ විෂබීජහරණ කටයුතු සඳහා ලබා ගැනීමට හැකි වී තිබුණි. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව ප්‍රතිලාභීන්ට අපේක්ෂිත ප්‍රතිලාභ ලබාදීමට අවශ්‍ය කටයුතු කළ යුතුයි. |
| (ආ) | මහකනදරාව ජලාශයෙන් ව්‍යාපෘතියට ජලය ලබා ගැනීමට අදාළව 2012 වර්ෂයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමට අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘතියේ ජල පවිත්‍රාගාරය නිමවීමෙන් පසු කෙටිකාලීන දෛනික ජල අවශ්‍යතාවය සඳහා ඝන මීටර් 6,700 ක් ලබා දීමට එකඟ වී ඇත. කෙසේ වෙතත්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව දැනට ජල | මහකනදරාවෙන් ජලය නිකුත් නොකිරීම හේතුවෙන් ජල සම්පාදන මණ්ඩලයට ඉලක්කගත ජල සම්බන්ධතා සපුරා ගැනීමට නොහැකි විය. මෙම ගැටළුව විසඳීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ජල සම්පාදන අමාත්‍යාංශය අතර ඉහළ මට්ටමේ සාකච්ඡා මගින් ඉහළ මට්ටමේ තීරණයක් අපේක්ෂා කෙරේ. | පවතින ගැටළු මඟහරවා ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පවිත්‍රාගාරයේ පරීක්ෂණ කටයුතු සහ නල මාර්ගවල විෂබීජහරණ කටයුතු සඳහා පමණක් දිනකට ජලය අක්කර අඩි 1 (ඝන මීටර් 1233) පමණක් නිකුත් කරන බව නිරීක්ෂණය විය. | | |
| (ඇ) | ජල මූලාශ්‍රය නොමැති වීමේ ප්‍රධාන ගැටලුවට පිළියමක් ලෙස රුපියල් මිලියන 381 ක ඇස්තමේන්තුගත මුදලකට ඒරු වැව ආර්බී ඇළ ප්‍රතිසංස්කරණය කර එහි අතිරික්ත ජලය මහකනදරාවට ගෙන ඒමට හැකි වන පරිදි මහකනදරාව වාරි පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර තිබූ අතර 2022 වර්ෂය අවසානය දක්වා සංවර්ධන කටයුතු සඳහා ජල සම්පාදන අමාත්‍යාංශය විසින් රුපියල් මිලියන 176 ක් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ගෙවා තිබුණි. කෙසේ වෙතත් මෙම විකල්ප විසඳුම අවසන් කර නොතිබූ අතර මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් මෙතෙක් වියදම් කළ මුදලට වටිනාකමක් ලැබී නොතිබුණු අතර අපේක්ෂිත ප්‍රතිඵල තවදුරටත් ප්‍රමාද විය හැකි බව නිරීක්ෂණය විය. | ඒරු වැවේ ආර්බී ඇළ ප්‍රතිසංස්කරණය කිරීමෙන් 2022 වසර තුල දී මහකනදරාවට අමතර ජලය අක්කර අඩි 3000 ලබා ගැනීමට හැකි විය. තවද, පිටවාන වැඩි කිරීමෙන් මහකනදරාව ජලාශයේ ධාරිතාව අක්කර අඩි 2400 කින් පමණ වැඩි වී තිබුණි. අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමට අනුව වාරිමාර්ග වැඩිදියුණු කිරීම් සම්පූර්ණ කිරීම සඳහා රුපියල් මිලියන 381 ක ඉතිරි මුදල (රුපියල් මිලියන 205 ) නිදහස් කිරීම අත්‍යවශ්‍ය වේ. | පවතින ගැටළු මගහරවා ගැනීමට සහ ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | වාරිමාර්ග දෙපාර්තමේන්තුව සමඟ අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමට අනුව මහවැලි අධිකාරිය මගින් දැනට ක්‍රියාත්මක වන එන්සීපී ඇළ ව්‍යාපෘතිය අවසන් කිරීමෙන් පසු ජල පවිත්‍රාගාරයට අවශ්‍ය සම්පූර්ණ ධාරිතාවය මුදා හැරීමට එකඟ වී ඇත. විගණනය මගින් මහවැලි අධිකාරියෙන් ලබාගත් තොරතුරුවලට අනුව, ඉහත ඇළ ව්‍යාපෘතිය සඳහා ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් කටයුතු තවමත් මූලික අදියරේ පවතින අතර 2030 වන විට අවසන් කිරීමට අපේක්ෂා කරන බවත් ව්‍යාපෘතියේ අවසාන කොටසේ සමහර පැකේජයන් ප්‍රදානය කිරීමට තවදුරටත් ඉතිරිව පවතින බව නිරීක්ෂණය විය. | එබැවින් ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන්ට ජලය සැපයීම සඳහා අවශ්‍ය ජල ප්‍රමාණය අඛණ්ඩව පවිත්‍රාගාරය වෙත ලබා ගැනීමට ඉහළ මට්ටමින් ස්ථිර තීරණයක් ගැනීමට නියමිතය. ඒ සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ජල සම්පාදන අමාත්‍යාංශය අතර ඉහළ මට්ටමේ සාකච්ඡාවක් බලාපොරොත්තු වන අතර එන්සීපී ඇළ ව්‍යාපෘතිය කඩිනම් කිරීම මහවැලි අධිකාරියට වගකීමක් ඇත. | පවතින ගැටලු මගහරවා ගැනීමට අදාළ බලධාරීන් සහයෝගීව ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඊ) | ලොට් ඒ කොන්ත්‍රාත්තුව යටතේ මහකනදරාව පවිත්‍රාගාර පරිශ්‍රයේ භාරකාර නිල නිවාසයක් ඉදිකිරීමට ව්‍යාපෘතිය මුලින් සැලසුම් කර තිබුණි. පසුව එය වෙනස් කර 2020 වසරේ මිහින්තලේ සංචාරක බංගලාවක් ලෙස ඉදිකිරීමට තීරණය කර ඇත. ගොඩනැගිල්ලේ ව්‍යුහාත්මක සිවිල් කටයුතු පමණක් අවසන් කර තිබූ අතර භූමි අලංකරණ කටයුතු ඇතුළු සියලු නිම කිරීමේ කටයුතු 2023 ජූලි 21 විගණිත දින වන විටත් සිදු | පිරිවිතර සහ ප්‍රමාණපත්‍ර වලට අනුව, ටයිල් රොසෙල් හෝ ඊට සමාන විය යුතුය. 2020 වසරේ සිට රජය විසින් පනවා ඇති ටයිල් ආනයනය තහනම් කිරීම හේතුවෙන් රොසෙල් ටයිල් මිලදී ගැනීම සඳහා විශාල පෝලිමක් පැවති අතර එහි ප්‍රතිඵලයක් ලෙස මිල විශාල ලෙස ඉහළ ගියේය. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරු වහලයේ | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය සහ මෙම කොන්ත්‍රාත්තුවේ ප්‍රමාණපත්‍ර හි පිරිවිතර මගින් ලබා දී ඇති උපදෙස් අනුව, නිශ්චිතව දක්වා ඇති ටයිල් හෝ ඊට සමාන |

| | | | |
|---|---|---|---|
| | කිරීමට ඉතිරිව ඇති බව නිරීක්ෂණය විය. තවද, මෙම ඉදිකිරීම් පිළිබඳව උපදේශකවරුන් විසින් කිසිදු අධීක්ෂණයක් සිදු කර නොමැති බවත්, කාර්යයේ ගුණාත්මකභාවය සහ අධීක්ෂණය වූ ආකාරය තහවුරු කිරීම සඳහා ලොග් පොතක් එම ස්ථානයේ පවත්වාගෙන ගොස් නොමැති බවත් නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස ඉදිකිරීම් සඳහා අඩු ප්‍රමිතියෙන් යුත් ද්‍රව්‍ය භාවිතා කිරීමේ හැකියාව පැවති අතර කොන්ත්‍රාත්කරු විසින් රොසෙල් සන්නාමය භාවිතා කිරීම වෙනුවට ආනයනික ටයිල් භාවිතා කර ඇති බව විගණන ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | ටෙරස් මත එම ආනයනික ටයිල් අතුරා ඇති අතර එය අනුමත කර නොමැති අතර තවමත් ගෙවීම කර නොමැත.<br><br>ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය විසින් සවිකරන ලද ටයිල්වල පිරිවිතරයන් අතර විචලනය පරීක්ෂා කරමින් සිටින අතර අඩු මිලක් යටතේ ටයිල් සඳහා ගෙවීමට ඇති හැකියාව සලකා බලයි. | ටයිල් භාවිතා කිරීම අත්‍යාවශ්‍ය වේ. |
| (උ) | 2022 මාර්තු මාසයේ සිට ආධාර දෙන නියෝජිතායතනය (ජේඅයිසීඒ) විසින් මුදල් ලබා දීම තාවකාලිකව අත්හිටුවීම හේතුවෙන්, සහතික කළ කොන්ත්‍රාත්කරුවන්ගේ බිල්පත්වල වටිනාකම රුපියල් මිලියන 666.5 ක ගෙවීම නතර කිරීමට සිදු විය. ඒ අනුව ව්‍යාපෘතියේ අවසන් අදියරේ කටයුතු සඳහා කොන්ත්‍රාත්කරුවන් සක්‍රියව සම්බන්ධ නොවේ. ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලයේ නඩත්තු කිරීම, වත්කම් පරිහරණයකින් තොරව ක්ෂය වීම, බැඳීම් ගාස්තු, ණය පොලී සහ වාරික සහ ප්‍රතිලාභීන්ගේ ආවස්ථික පිරිවැය වැනි අනවශ්‍ය හා ආර්ථික නොවන වියදම් අවම කිරීම සඳහා ව්‍යාපෘතියේ ඉතිරි කොටස සම්පූර්ණ කිරීමට වගකිවයුතු නිලධාරීන් විසින් මෙම ක්‍රියාමාර්ගය ගෙන නොතිබුණි. | සහතික කළ බිල්පත් සඳහා ගෙවීම් ප්‍රමාද කිරීම හේතුවෙන් කොන්ත්‍රාත්කරුවන් දැඩි මුදල් ප්‍රවාහ ගැටලුවලට මුහුණ දී සිටින නමුත් ඉතිරි කටයුතු මන්දගාමී ප්‍රගතියකින් කරගෙන යයි. රජයේ අරමුදල් යොදාගෙන සිදුකරන වියදම ඉදිරියේදී ප්‍රතිපූරණය කිරීමට ජයිකා ආයතනය එකඟ වී ඇත. එබැවින් ශ්‍රී ලංකා රජයෙන් හිඟ මුදල් ලබා දෙන ලෙස භාණ්ඩාගාරයට ඉල්ලීම් කර ඇත.<br><br>ඒ අනුව, දේශීය අරමුදල් යොදාගෙන වුවද හිඟ බිල්පත්වලින් කොටසක් පියවීමට සක්‍රීයව සම්බන්ධ වන ලෙස ව්‍යාපෘති කලමණාකරණ කාර්යාලය විසින් ජල සම්පාදන අමාත්‍යාංශය, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ ජයිකා ආයතනය වෙත තත්ත්වය දන්වා ඇත. පරිපාලනය සහ අනෙකුත් පුනරාවර්තන වියදම් අඩු කිරීමට පියවර ගනිමින් සිටී. | ව්‍යාපෘතියේ ඉතිරි කටයුතු අවසන් කිරීමටත්, හිඟ බිල්පත් කඩිනමින් පියවීමටත් අවශ්‍ය පියවර ගත යුතුය. |

### 3 .4 මතභේදයට තුඩුදෙන කරුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| 2022 ජනවාරි සිට මාස 18 ක කාලයක් සඳහා කාර්ය මණ්ඩල වැටුප් සහ අනෙකුත් පරිපාලන වියදම් ලෙස ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 38.33 ක් වැය වී ඇතත්, එම කාලය සඳහා ව්‍යාපෘතියේ සමස්ත ප්‍රගතියේ වැඩිවීම සියයට 3.39 කි. 2021 දෙසැම්බර් 31 වන විට මෙම ව්‍යාපෘතියේ අවසන් කිරීමට ඉතිරිව පැවතියේ සියයට 4.54 ක වැඩ පමණක් වුවත් ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා සම්බන්ධ වූ කොන්ත්‍රාත්කරුවන්ගේ හිඟ බිල්පත් නොගෙවීම හේතුවෙන් ඔවුන්ගේ දුර්වල ක්‍රියාකාරීත්වය මත ව්‍යාපෘති කාර්යාලයක් ආර්ථික නොවන ආකාරයෙන් පවත්වාගෙන යාමට සිදු වී තිබුණි. | ව්‍යාපෘති කළමණාකරණ කාර්යාලය ජල සම්පාදන මණ්ඩලය සතු නිල නිවාසයකට ගෙන ගොස් තිබූ අතර කාර්ය මණ්ඩලය අඩු කරන ලදී. ඉතිරි කටයුතු සම්පූර්ණ කිරීම, කොන්ත්‍රාත්කරුගේ අවසන් බිල්පත් පරීක්ෂා කිරීම, වැඩ භාරදීම සහ ව්‍යාපෘතියේ ප්‍රාග්ධනීකරණය සඳහා අත්‍යාවශ්‍ය අවම කාර්ය මණ්ඩල සංඛ්‍යාව 5ක් සමඟ ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය ක්‍රියාත්මක වේ. | ආර්ථික නොවන වියදම් අවම කිරීමට කටයුතු කළ යුතුයි. |

### 3.5 ව්‍යාපෘති පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ජල පවිත්‍රාගාරයේ (ඩබ්ලිව්ටීපී) රසායනාගාරයට සහ ප්‍රධාන ගබඩාවලට කොන්ත්‍රාත්කරුවන් විසින් භාර දුන් රුපියල් මිලියනයක රසායනාගාර උපකරණ, ජල සම්බන්ධක උපකරණ, පයිප්ප, සවිකිරීම් සහ උපාංගවල මුළු වටිනාකම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අංක 751 දරන මුල්‍ය රෙගුලාසි ප්‍රකාරව වාර්තා පවත්වා ගෙන නොතිබුණි. | සඳහන් කර ඇති භාණ්ඩ භාරදීමේ ක්‍රියාවලිය සිදුවෙමින් පවතින අතර හැකි ඉක්මනින් එම ක්‍රියාවලිය අවසන් කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. | රජයේ නීති රීතිවලට අනුකූලව කටයුතු කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | 2010 ජූලි 26 දිනැති අංක 05 කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව ව්‍යාපෘතියේ කටයුතු 2022 වර්ෂයේදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනය කර නොතිබුණි. | සාමාන්‍යයෙන් ව්‍යාපෘති ක්‍රියාකාරකම් ආරම්භයේ සිටම ජලසම්පාදන මණ්ඩලයේ අභ්‍යන්තර විගණනය මගින් විගණනය කර ඇත. කෙසේ වෙතත් ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලයෙහි අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණනය නිතිපතා සිදුකිරීමට පියවර ගත යුතුය. |